**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**සිංහල අංශය**

**පාසල් නිවාඩු කාලයට ශිෂ්‍ය උපකාරක අත්වැල**

# අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිකාර්ය වැඩසටහන

# සිංහල භාෂාව හා සාහිත්‍යය

# 11 ශ්‍රේණිය

---

**අංක (i) සිට (xv) තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනු කොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

1. (i) (අ) අමාවතුර ලියැවුණු සාහිත්‍ය යුගය කුමක් ද?
   (ආ) එහි පරිච්ඡේද කීයක් අන්තර්ගත වේද?

(ii) (අ) අමාවතුර ග්‍රන්ථයේ කතුවරයා නම් කරන්න.
(ආ) මෙම කෘතිය සඳහා මුල් කර ගත් බුදු ගුණය කුමක් ද?

(iii) (අ) අමාවතුර රචනා කිරීමේ කතුවරයාගේ බලාපොරොත්තුව කුමක් වී ද?
(ආ) ඉන් කියැවෙන අදහස කුමක් ද?

(iv) (අ) අමාවතුර කතුවරයා උපයෝගී කොට ගෙන ඇත්තේ සිංහල කතා කලාවේ කුමන රීතිය ද?
(ආ) අඟුල්මල් දමනයේ හත් වැනි පරිච්ඡේදයේ අන්තර්ගත කතාව කොතැන් සිට කොතැන දක්වා වේ ද?

(v) "ආචාර්යයා අඹුව හා සසඟ ඇත්තේ යයි බිඳපියම්හ."
(අ) මෙම ප්‍රකාශය කළෝ කවරහු ද?
(ආ) මෙහි සඳහන් පරිදි බිඳපියන්නට අදහස් කරන්නේ කවුරුන්ව ද?

(vi) "ගම් නැති තැන මහ වල්හි සිටියෙ සිවුපද ගයක් අසා මා කෙරෙහි පැවිජි වැ රාත් වෙයි."
(අ) මේ ප්‍රකාශයෙන් කියැවෙන්නේ කවුරුන් පිළිබඳව ද?
(ආ) 'සිවුපද ගයක්' යන්නෙහි අදහස ලියන්න.

(vii) "වහන්සෙ, ඇප් උන් වඳම්හ. දුටු කල හුනස්නෙන් නැගෙම්හ."
(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) මෙහි 'උන්' යනුවෙන් සඳහන් වන්නේ කවුරුන් පිළිබඳ ව ද?

(viii) (අ) උග්ගසේන සිටුපුත්හුගේ වස්තුව උපුටා ගත් කෘතිය කුමක් ද?
(ආ) එම කෘතිය ලියැවුණේ කුමන සාහිත්‍ය යුගයක ද?

(ix) (අ) මෙම කෘතිය ලියූ කතුවරයා නම් කරන්න.
(ආ) සද්ධර්මරත්නාවලිය රචනා කිරීමේ කතුවරයාගේ අරමුණ සඳහන් කරන්න.

(x) (අ) සද්ධර්ම රත්නාවලිය රචනා කිරීම සඳහා ඇසුරු කොට ගත් ග්‍රන්ථය කුමක් ද?
(ආ) එහි කතුවරයා නම් කරන්න.

(xi) (අ) සද්ධර්ම රත්නාවලිය ඇසුරු කර ගත් පාලි ග්‍රන්ථයේ පදානුගත පරිවර්තනයක් නොවන බව සඳහන් පාඨය උපුටා ලියන්න.

(ආ) සද්ධර්ම රත්නාවලියෙහි ඔබට නියමිත කී වැනි කතා වස්තුව ද?

(xii) (අ) මෙම කතා වස්තුව ඇසුරෙන් ඔබට ලබා දෙන පණිවුඩය කුමක් ද?

(ආ) උග්ගසේන සිටුපුත්හුගේ වස්තුව ගෙන හැර දක්වන්නේ කුමක් හැඟවීමට යයි එහි සඳහන් වේ ද?

(xiii) (අ) විවාහය පිළිබඳ ව උග්ගසේනයන්ගේ දෙමාපියන් ඔහුට ලබා දුන් පණිවුඩය කුමක් ද?

(ආ) විද්දත් පියා උග්ගසේනයන්ගේ යාළුවාණන්ට කීවේ කුමක් ද?

(xiv) (අ) විද්දත් දියණිය උග්සේනයන් තම කොල්ලකු තරම් නොසලකා හැරීමට හේතු වූ කරුණු දෙක ලියන්න.

(ආ) මෙම ගැටලුවෙන් මිදීම සඳහා උග්ගසේන කුමක් කළේ ද?

(xv) "උග්ගසේන නම් සිටුපුත්‍රයාට ශිල්ප දක්වන්නට කියව."

(අ) මෙම ප්‍රකාශය කළෝ කවරහු ද?

(ආ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් වෙත ද?

(ලකුණු 02 x15 = 30යි)

2. පහත දැක්වෙන ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) (අ) බුදුන් වහන්සේ අඟුල්මල් දමනය සඳහා වඩින විට එහි නොවඩින්න යයි කෑ ගසා කීවෝ කවරහු ද?

(ආ) ඔවුන් බුදුන් වහන්සේ හඳුනා නොගත්තේ යයි සඳහන් වන කරුණු දෙකක් ලියන්න.

(ii) "මෙතැන් පටන් -ගෙනැ පව් නො කෙරෙමි; තොපගෙ මියුරු අසා " යැයි ත මාගෙ පඤ්චායුධ ප්‍රපාතයෙහි බහා-පියා බුදුන් වැඳැ පැවිජ අයදි යැ. බුදුහු ඔහුට එහිභික්ෂුභාවයෙන් පැවිජි දුන්හ.

(අ) මෙහි සඳහන් වන පඤ්චායුධ නම් කරන්න.

(ආ) සමස්ත පාඨයෙහි අදහස ලියන්න.

(iii) "කිම මහරජ, තට බිම්සර මහරජ කුපිත වියැ හො? විසාලා මහනුවර වැසි ලිච්ඡවී රජ දරුවන් කුපිත වූහ හො? සෙසු ප්‍රතිපක්ෂ රජදරුවන් කුපිත වූහ හො? යි වදාළහැ.

(අ) බුදුන් වහන්සේ කොසොල් රජුගෙන් මෙසේ විමසීමට හේතු වූ කරුණ කුමක් ද?

(ආ) කොසොල් රජු බුදුන් වහන්සේ මුණගැසීමට පැමිණියේ කිනම් කරුණක් මුල් කරගෙන ද?

(iv) "මැගේ මේ අභිමානය මැට වඩා සම්පත් ඇත්තන් ඇති හෙයින් සම්පතක් නිසාත් නොවෙයි. තමා ජාති සම්පන්න නොවන හෙයින් ජාතියක් නිසාත් නොවෙයි. රූපත් හෙයින් ඒ හා තමා දන්නා ශිල්ප පමණක් නිසා ය."

(අ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ආ) මෙහි සඳහන් වන පරිදි ඇය අභිමානයක් ඇති කර ගෙන ඇත්තේ කවර හේතු නිසා ද?

(v) උග්ගසේනයෝත් තමන් පානා කෙළි තමන් ම දක්නා පමණක් මුත් රැස් වූවන් නොබලන නියාව දැන **මුසුප්පුව** ගොසින් හවුරුද්දකින් සමසෙකින් අරුමයක් සේ පානා කෙළි බුදුන් අවුත් මෙතැනට සම්බව ඔබ ම අමුතු ව පහළ වූවා සේ බලන බව මුත් මෙනුවරට මා **ආදියෙන්** පානා කෙළි බලන්නෝ නැත.

(අ) ‘තමන් පානා කෙළි තමන් ම දක්නා පමණක් මුත්' යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අදහස ලියන්න.

(ලකුණු 04x05 =20යි)